# සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය (2024)

(කලාප මට්ටම)

| | | |
|---|---|---|
| 01. අපේක්ෂකයාගේ නම<br>(මුලකුරු සමඟ නිවැරදිව ලියන්න) | :- | ........................................................................................ |
| 02. පාසලේ නම | :- | ........................................................................................ |
| 03. පාසල් වර්ගය | :- | .200 තෙක්/201-500 අතර/500 ට වැඩි |
| 04. කොට්ඨාසය | :- | ........................................................................................ |
| 05. කලාපය | :- | ........................................................................................ |

8 ශ්‍රේණිය **<u>සාහිත්‍ය දැනුම මිනුම</u>** කාලය පැය 2 යි.

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න

01. නිවැරදි වරණය තෝරා ඉරක් අඳින්න.

i. ජන සාහිත්‍යයේ ප්‍රභේදයක් නොවන්නේ

i. වීරකාව්‍ය ii. යුගල පද iii. උපමාකතා iv. පුරාණෝක්ති

ii. සාම්ප්‍රදායික යෙදුම් විශේෂයක් වන්නේ.

i. තනිපද ii. යුගල පද iii. සමානපද iv. විශේෂණ පද

iii. රබීන්ද්‍රනාත් තාගෝර්ගේ උපන් වර්ෂය වනුයේ

i. 1861 ii. 1852 iii. 1862 iv. 1872

iv. රබීන්ද්‍රනාත් තාගෝර්තුමා

i. ඉන්දියානු ජාතිකයෙකි ii. බෙංගාල ජාතිකයෙකි

iii. ප්‍රංශ ජාතිකයෙකි iv. ශ්‍රී ලංකිකයෙකි

v. ශාන්ති නිකේතනය අරඹන ලද්දේ,

i. 1901දී ii. 1910දී iii. 1861දී iv. 1914දී

(ලකුණු 2x5 = 10)

02. පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | ප්‍රකාශය | ප්‍රකාශය ඇතුළත් පාඩම | කවුරුන් විසින් කියන ලද්දක්ද? | කාහට කියන ලද්දක්ද? |
|---|---|---|---|---|
| i | ''ඔන්න සාස්තරේ හරියට කියවීගෙන එනවා නේද? | | | |
| ii | පරණ අවුරුද්දට නාන්නයි වැඩ අත්හරින්නයි තියෙන්නෙ අදයි | | | |
| iii | ''මොනවද විදානෙගේ වැරදි?'' | | | |

| | | | | |
|---|---|---|---|---|
| iv | ''දැන් එහෙනම් ගෙදර යන්න'' | | | |
| v | ''ඉතින් මොකක් ද කාරණය'' | | | |

(ලකුණු 3x5 = 15)

03. පෙලපොතෙන් උපුටාගෙන ඇති පහත සඳහන් පද්‍ය සම්පූර්ණ කරන්න.

i. ...........................................................................

...........................................................................

නතර ලමින් ගුවනේ ඕංචිල්ලා
මෙවර පදිමු අපි රං ඕංචිල්ලා

ii. හඳහාමී අප දිහාව
එබී බලයි පා හිනාව
..........................................................
..........................................................

iii. දිසාවෙනැයි මේ හිරු එන්නෙ පායා
හැරී සිටී සූරියකත් ගසේ මල්
.............................................................
.............................................................

iv. ..............................................................

..............................................................

යෙදෙමින් වැඩෙහි ජාතික බල අදත් මගේ
නිදහස් සිරිය ගෙන්වමු සොහොයුරන් මගේ

v. වෙන වෙන හොඳ පාට ඇඳුම්
ඇඟගත් පොඩි ළමයි පෙළක්
..............................................................

..............................................................

(ලකුණු 2x5 = 10)

04. **පහත සඳහන් වැකි හරිනම් ( ✓) ලකුණද , වැරදි නම් (✗) ලකුණද යොදන්න**

i. එළිසමය සහ උපමා මගින් ශබ්ද රසය ඇතිවේ. (..................)

ii. ජනකතාවක ප්‍රධාන අරමුණ මිනිසාට යථාර්ථය පෙන්වීමයි. (..................)

iii. අවස්ථාවකට ගැලපෙන කියමන ප්‍රස්තාව පිරුළක් නොවේ. (..................)

iv. සාහිත්‍යය සඳහා නොබෙල් ත්‍යාගය දිනාගත් ප්‍රථම ආසියාතිකයා තාගෝර්ය. (..................)

v. සැළලිහිණි සංදේශය දඹදෙණි යුගයේ දී රචනා වුවකි. (..................)

(ලකුණු 2x5 = 10)

05. පහත දැක්වෙන පද වල අර්ථය ලියන්න.

i. පෘථුල - .................................

ii. විලිකුන් සුරත්පල - .................................

iii. පුරාණෝක්ති - ..............................

iv. සව්සත - ...................................

v. තෙලිතුඩ - ....................................

vi. බරණි - .......................................

vii. රුපුනොද - ...................................

viii. සිදගන - .....................................

ix. රුවනාර - ....................................

x. වසුන්ධරා - ......................................

(ලකුණු 1x5 = 10)

06. පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

i. අර්ථ රසය ඇති කිරීමට යොදා ගන්නා කාව්‍ය උපක්‍රම 02 ක් නම් කරන්න ................................

ii. තාගෝර් බටහිර ලෝකය පිළිබඳව ලියූ චෝදනාත්මක කෘතිය කුමක්ද? ......................................

iii. ''පෙත්සම'' නැමැති කෘතිය රචනා කලේ කවුරුන්ද? ..............................................

iv. මනමේ නාටකයේ රචකයා නම් කරන්න ................................................................

v. කතරගම දේවාලයේ නින්දගම් පරිපාලනය භාරව සිටියේ කාටද? ..................................

(ලකුණු 2x5 = 10)

07. ගීතය ඇසුරින් පිළිතුරු ලියන්න

වැසි වසිනා අහස අපි
මුතු බඳිනා මුහුද අපි
මිණි දිලෙනා පොළොව අපි
සිරි ලංකා රටම අපි

i. ඉහත ගීතයේ රචකයා නම් කරන්න. ......................................................

ii. මෙහි සඳහන් කාව්‍ය උපක්‍රම 02 ක් කම් කරන්න

............................................................ ............................................................

iii. මිණි යන්නට සමාන පදයක් දක්වන්න .............................................

iv. මෙහි සඳහන් ස්ථාන 03 ක් නම් කරන්න ..........................................................................

v. මෙහි ඇති රූපකයක් ලියා දක්වන්න. ...................................................................................

(ලකුණු 1x5 = 5)

08. ජනකවි වර්ග දෙකක් නම්කර ඒ සඳහා උදාහරණ ලියන්න.

................................................................ ................................................................

................................................................ ................................................................

................................................................ ................................................................

................................................................ ................................................................

(ලකුණු 2x5 = 10)

09. පහත සඳහන් කවිවල අර්ථය ලියන්න.

i. අත් වැඩ පර වැඩ සමව සිතන්නේ
මෙත් සිත සව් සත කෙරෙහි කරන්නේ
එත් බැරිනම් තොප සසර ගෙවන්නේ
සෙත්පුර සැප කෙලෙසකද ලබන්නේ

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

ii. වදිමින් සවස නල හැසිරෙන දිග තුවල
සොබමන් සුනිල් මිණි නිල් නුඹ තුර විපුල
පතසන් අවර ගිර නැටියෙන් වැටෙන කල
විලිකුන් සුරත් පල වැනි වේ රිවි මඬල

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(ලකුණු 10)

10. පහත මාතෘකා අතරින් එකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න

i. වීදාගම මෛත්‍රී හිමි

ii. කාව්‍ය උපක්‍රම

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

ලකුණු - 10